# දහම්සොඬ ජාතකය

ජාතක කථාවඃ- යටගිය දවස බරණැස රාජ්‍යකළ බ්‍රහ්මදත්ත රජුට දහම්සොඬ නම් කුමාරයෙක් විය. ඒ කුමාරයා ක්‍රමයෙන් වැඩි සූසැට කලා ශිල්පද අෂ්ටා දස පුරාණ ද අවි ශිල්පද නිමවා සොලොස් හැවිරිදි කල්හි යුව රාජ තනතුරට ද පියාගේ ඇවෑමෙන් රජකමද ලැබ චතුර් විධවූ උපායෙන්ද ත්‍රිවිධ ශක්තියෙන්ද ෂඩ් ගුණයෙන්ද සප්තාංග යෙන්ද චතුස්සංග්‍රක වස්තුවෙන්ද යුතු ව රට ආරක්ෂා කරමින් සිටින කල්හි දිනක්මෙබඳු සිතිවිල්ලක්ඇති විය.

සංසාරයෙහි වාසය කරන සත්වයා කෙරෙහි මෛත්‍රී කරුණා වෙන් නිවන් පුරයට පමුණුවන අපගේ සර්වඥයන් වහන්සේ විසින් අමෘතය මෙන් දේශනා කරනලද ශ්‍රී සද්ධර්මය දැන නොගෙන සැළකීමක් නොකොට කරන්නා වූ මේ රජකම මට සුදුසු නොවෙයි. එය වෙරළ නැති රළ මෙන්ද චන්ද්‍රයා නැති අහස මෙන්ද ප්‍රදීපය නිවී ගිය ගෙය මෙන්ද දළසුන් මස්ත හස්තියා මෙන්ද පියුම නැති විල මෙන්ද නාසය බුන් චක්ත්‍රය මෙන්ද නොහොබින්නේයයි මෙසේ සිතා රෑ පහන් වූ කල්හි සුවඳ පැන් සනහා සර්වආභරණින් සැරසී සුර සබයට යන ශක්‍රයා පරිද්දෙන් රාජ සභාවට පැමිණ සිංහාසනාරූඪව අමාත්‍ය මණ්ඩලය අමතා තිලොවට ගුරු වූ මුනිද්‍රයන් වහන්සේ දෙසූ ධර්මය මට කියව් තොප එසේ උතුම් ධර්මය ප්‍රකාශ කළ හොත් අපමණ රාජ සම්පත් සමඟ මුළු රාජ්‍යයම පුදමි. මේ ගැන සැකනොකරව් කීහ.

උන් එකෙකුදු ධර්මය නොදන්නා බව ප්‍රකාශකල කල්හී මගුලැතුන් සරසවා දහසින් පබැඳි පියල්ලක් ඒ මත තබාමුනිඳුන් දෙස ධර්මය එක් ගාථාවකින් හෝ ගාථා අඩකින්වත් මට කිසිවෙකු කිවහොත් මේ සම්පත් ඔහුහට දෙමි. තවද ඔහුගේ දාස බවට පත්වෙමියි ප්‍රකාශකොට යැවූහ. මෙසේ ද විමසා බණ දත් කිසිවෙකු නොලදින් මහත් සේ කළකිරී රාජ්‍ය ශ්‍රී අත්හැර ධර්මය සොයනු පිණිස වනයට නික්ම ගියේය.

තමාගේ පාරමිතා බලයෙන් ඒ මහා වනයේ විෂඝෝර සර්පයන් ගෙන් පීඩා නොවිද ගතවෙමින් යන කල්හි මේ මහතාණන්ගේ ප්‍රත්‍ය මහිමයෙන් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ ශෛලාසනය හුණු වී වහා එහි පැමිණ තවත් පරික්ෂා කරමියි සිතා අංජන කැටයක් මෙන් භයානක උස්වූ ශරිරයකින්ද හිසෙහි යකඩ බිලී මෙන් කකීෂවූ කේෂයෙන්ද රෞද්‍රරක්ත වර්ණ ඇස් දෙකකින්ද නැමිගිය දළවලින් යුතු රාක්ෂය වේසකින් දහම්සොඬ රජ්ජුරුවන් වෙතට ළංව එක් අතකින් යගදාව සොළව සොළවා එක් අතකින් දැලි රැවුල ඇද ඇදසිට රැ ත්තේය.

රජ්ජුරුවන් වහන්සේ ඒ බියකරු යක්ෂයා දැක මදකුදු තැතිගැනීමක් නැතිව වහා ඉදිරියට ගොස් පින්වත, දෙලොව ජයගතහැකි බණ පදයක් තා විසින් අද කිවහොත් රාජ්‍ය ශ්‍රී සමග මාගේ ජීවිතයද දෙමියි කීහ. එවිට රකුසා බඩගින්න ඉවසිය නොහැක. තොපව අනුභව කොට බණ කියමි යි කීය. රජ්ජුරුවන් වහන්සේ ඒ අසා බණ ඇත්තේ පණ ඇත්තම් වෙද? මම නැත්තම් තාගේ බණ අසන මෙහි කවුරු වෙක්ද? රකුසානෙනි, තොපගේ සාගින්න සහ මගේ දහම් දොළ දුක එකවිට විසදෙන සේ මඟක් විමසා කියවයි කීය.

එබසට රකුසා ස්වාමිනී, තොපට සදහම් ලාභයද අප හට වන මාංශ ලාභයද එකවිට පසීඳමියි කියා සිය ගණන් කූටයන්ගෙන් යුතු අහසෙහි ගැටි පවත්නා මහා පර්වතයක් මවා තොප මේ ගිරට පැන මාගේ කටට පණිනු මම ඒ අතර තොපට ධර්මය දේශනා කරමි. වහා නැගෙවයි කීහ. රජ්ජුරුවන් වහන්සේ බුදුගුණ සිහිකර කෙනෙක් පර්වත. ගස් වැල් වලින් වැටී ද කෙනෙක් විස පානය කොටද මිය යන්නාහ. ද්වි වලසුන්ට ගොදුරු වන්නාහ. ධර්මය නිසා මාගේ ජීවිතය තොරවීම නිසරු නොවේවැයි සිතා මහා ගිනිසිඛරයට නැඟ ගිනි වලක් බඳු රාක්ෂයා ගේ දැල් වූ බියකර මුඛය දැක මදකුදු කම්පා නොවී සිට රාක්ෂයා අනිච්චාවත සංඛාරා - උප්පාද වය ධම්මිනො, උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසංවූප සමො සුඛො යන ගාථාව කියන කල්හි බුදු බව පතා එක් වරම රාක්ෂයාගේ මුවට පැන්නේය. ඒ මෙහොතෙහිම ශක්‍රයා බියකරු වේශය අත්හැර නියම වෙස් ගනිමින් දහම් සොඬ රජ්ජුරුවන් දෙ අතින් වඩාගෙන දෙව්ලොව ගෙනයන සිතින් අහසට නික්මී කොදිව් මහදිව් පසුකොට උතුම්වූ තව්තිසා දිව්‍ය ලෝකයට ප්‍රවිෂ්ටම නන්දනොද්‍යානයද නන්දා පොකුණ ද තෙතිසක් කුඹින් ජ්වලිත වූ ඓරාවන හස්තිරාජයාදම් නහර දිව්‍යප්සරාවන්ද දකිමින් සුධර්මා නම් ධර්ම සභාවට ප්‍රවිෂ්ට ව දහම් සොඬරජ්ජුරුවන් ව පාණ්ඩුකම්බුල ශෛලාසනයෙහි වඩා හිඳුවා ගඳ දුම් මල් පුදා ධර්මදේශනා කරන සේ ආරාධනා කළහ.

ආකාශ මධ්‍යයට පැමිණි චන්ද්‍රයා මෙන් දහම්සොඬ රජ්ජුරුවන් වහන්සේ දිව්‍ය සමූහයා පිරිවරාගෙන ධර්ම දේශනා කළ සේක. ශක්‍රදේවේන්ද්‍රයා ඒ මිහිරි වූ ශ්‍රී සද්ධර්මය අසා සන්තොසයට පැමිණ ස්තුති ඝෝෂා කොට ආශිර්වාද පතා මනුලොවට ඇරලූහ. දහම්සොඬ රජතුමා නැවත තම රජ සැපතට පත්ව බුදුබව පතා

පෙරසේම දැහැමින් සෙමින් රාජ්‍යය කෙළේය.

එසමයෙහි දහම්සොඬ රජව උපන්නේ දැන් සම්මාසම්බුදු රජුන්ය.